ආ. වි. 35 'බී'

# ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

## ගමන් බලපත් අයදුම් කරන්නන් සඳහා උපදෙස්

*(මෙය අයදුම්පත්‍රය සමග නොමිලේ නිකුත් කෙරේ)*

*(කරුණාකර අයදුම්පත පිරවීමට පෙර සියලු උපදෙස් කියවන්න.)*

### (අ) අයදුම්පත්‍ර (ආ. වි. 35'කේ') සම්පූර්ණ කිරීමට උපදෙස් :

(01) අවශ්‍ය ගමන් ලියවිල්ලේ වර්ගය : (i) සියලුම රටවල් සඳහා ද, (ii) මැද පෙරදිග ඇතුළු නිශ්චිත රටවල් - ඉන්දියාව, නේපාලය, බංගලාදේශය, පකිස්ථානය, මාලදිවයින් සමූහාණ්ඩුව, ඉරානය, ඉරාකය, ලෙබනනය, සිරියාව, ජෝර්දනය, සවුදි අරාබිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ඕමානය, කුවේටය, කටාර්, බහරේන් සහ යේමනය යන රටවල් සඳහා ද, (iii) හදිසි සහතික : ඉන්දියාව සහ නේපාලය සඳහා ද, (iv) හඳුනාගැනීමේ සහතික - සියලුම රටවලට හෝ නිශ්චිත රටකට වලංගුකොට නිකුත් කෙරේ. (අදළ කොටුව තුළ "√" සලකුණු කරන්න.)

(2) අවසන්වරට ලබා ගත් ගමන් ලියවිල්ලේ (ගමන් බලපත්‍රය / හදිසි සහතිකය / හඳුනාගැනීමේ සහතිකය) අංකය මෙහි ලියන්න. මෙරට දී එය නැතිවූයේ නම්, පොලීසියට කරන ලද පැමිණිල්ලේ සහතික කළ පිටපතක් හෝ විදේශයක දී නැතිවූයේ නම් මෙරටට පැමිණීම සඳහා භාවිතා කරන ලද තාවකාලික ගමන් ලියවිල්ලේ ඡායාස්ථිති පිටපතක් ද සමග ඉදිරිපත් කළ යුතුය. (පළමු වරට අයදුම් කරන්නන්ට මෙය අදළ නොවේ.)

(3) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් නිකුත් කළ ජාතික හැඳුනුම්පතේ අංකය ලියන්න. වයස අවුරුදු 16 ට වැඩි සෑම තැනැත්තෙක් ම තම ජාතික හැඳුනුම්පත එහි ඡායාස්ථිති පිටපතක් ද සමග ඉදිරිපත් කළ යුතුය.

(4) ඔබේ මුල් නම (වාසගම/පෙළපත් නම) එක කොටුවක එක අකුර බැගින් ලියන්න. නම් අතර එක් කොටුවක ඉඩක් හිසව තබන්න.
*අයදුම්කාරියක් විවාහයෙන් පසු ඇයගේ ස්වාමි පුරුෂයාගේ නම ඇතුළත් කොට ගමන් බලපත්‍රය අයදුම් කරන්නේ නම් එම නාමය සඳහන් කරන්න. (මෙහිදී විවාහ සහතිකයේ මුල් පිටපත ඡායාස්ථිති පිටපතක් ද සමග ඉදිරිපත් කළ යුතුය.)

(5) අංක 04 යටතේ කොටුවල ලියූ ඔබේ මුල් නම / වාසගම හැර ඔබේ සම්පූර්ණ නමේ ඉතිරිය මෙම කොටුවල ලියන්න.

(6) ඔබේ ස්ථිර ලිපිනය මෙහි ලියන්න. (ශ්‍රී ලංකාවේ පදිංචි ස්ථානයේ ලිපිනය විය යුතුය.) නගරය සහ දිස්ත්‍රික්කය අදල කොටුවල ලියන්න.

(7) පදිංචි ස්ථානය අයත් දිස්ත්‍රික්කය මෙහි සඳහන් කළ යුතුය.

(8) උපන් දිනය (උප්පැන්න සහතිකයට අනුව)

(9) උප්පැන්න සහතිකයේ අංකය හා දිස්ත්‍රික්කය (උප්පැන්න සහතිකයේ මුල් පිටපත ඡායාස්ථිති පිටපතක්ද සමග ඉදිරිපත් කළ යුතුය.)

(10) උපන් ස්ථානය, උප්පැන්න සහතිකයේ දැක්වෙන පරිදි සඳහන් කරන්න.

(11) අදල කොටුව තුළ "√" සලකුණු කරන්න.

(12) ඔබේ උස සෙන්ටිමීටර්වලින් සඳහන් කරන්න. (අඩි 1 = සෙන්ටිමීටර් 30.4කි. අඟල් 1 = සෙන්ටිමීටර් 2.54කි.)

(13) අදල කොටුව තුළ "√" සලකුණු කරන්න.

(14) ඔබේ රැකියාව / වෘත්තිය / තරාතිරම හෝ තනතුර මෙහි ලියන්න. වචන අතර එක් කොටුවක ඉඩක් හිස් ව තබන්න. ( රැකියාව සනාථ කිරීමට අවශ්‍ය අධ්‍යාපන සහතික / වෘත්තීය සහතික / වෘත්තිය සනාථ කිරීමේ සහතිකවල මුල් පිටපත් ඡායාස්ථිති පිටපත් ද සමග ඉදිරිපත් කළ යුතුය.)

(15) ඔබ ගේ ගමන් බලපත්‍රයට ඇතුළත් කරනු ලබන දරුවන් ගණන ලියන්න.

(16) ඔබ විදේශ රටක පුරවැසිභාවය හෝ ශ්‍රී ලංකාවේ ද්විත්ව පුරවැසිභාවය හෝ ලබාගෙන ඇත්නම් අදළ කොටුවේ "√" සලකුණු කරන්න.
(ශ්‍රී ලංකා ද්විත්ව පුරවැසිභාවය ලබා ඇත්නම් එම සහතිකය ඡායාස්ථිති පිටපතක් ද සමග ඉදිරිපත් කරන්න.

(17) ඔබව සම්බන්ධ කළ හැකි ජංගම දුරකථන අංකය සඳහන් කරන්න.

(18) ඔබගේ ඊමේල් ලිපිනය සඳහන් කරන්න.

(*) ගමන් බලපත්‍ර අයදුම්පත සහතික කළ හැකි අය පිළිබඳ විස්තරය පසුපිටෙහි සඳහන් වේ.

### (ආ) ඡායාරූපය :

(i) සෙන්ටිමීටර් 3.5 × 4.5 ප්‍රමාණයෙන් වර්ණ ඡායාරූප 3ක් ඉදිරිපත් කළ යුතුය.

(ii) මෙම ඡායාරූප දිලිසෙන හෝ අඩ දිලිසෙන ඡායාරූප නොවිය යුතුය.

(iii) ඡායාරූපයේ මුහුණ සෘජු ව තිබිය යුතු අතර, කන් දෙකම දෘෂ්‍යමාන විය යුතුය.
(කන් වසාගත් ඡායාරූප ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

(iv) ඡායාරූපය ඉහළ ප්‍රමිතියකින් යුතු කඩදාසියක තීන්ත සලකුණු සහ තිත් නොමැතිව පැහැදිලිව මුද්‍රණය කර තිබිය යුතුය.

(v) මුහුණේ ඉරියව් වෙනස් නොකොට ඡායාරූපය තිබිය යුතුය.

(vi) අව් කන්ණාඩි, වර්ණ කන්ණාඩි, තද පැහැති රාමුවක් සහිත කන්ණාඩි පැළඳ ඡායාරූප නොගත යුතුය. එසේම කන්ණාඩි පැළඳ ඡායාරූප ගන්නේ නම් ඇස් මනාව පෙනෙන ලෙස සහ කාච තුළින් ආලෝක පරාවර්තනයක් නොවන පරිදි ගන්නා ඡායාරූප ඉදිරිපත් කළ යුතුය.

### (ඇ) දෙමාපියන්ගේ ගමන් බලපත්‍රවලට දරුවන් ඇතුළත් කිරීම සඳහා අදල තොරතුරු හා උපදෙස් :

(i) ඒ සඳහා ආ. වි. 35 'සී' ආකෘති පත්‍රය මගින් ඉල්ලුම් කළ යුතුය.

(ii) දරුවන්ගේ නම්, ඔවුන්ගේ දෙමව්පියන්ගේ ගමන් බලපත්‍රවලට ඇතුළත් කිරීම සඳහා ඉල්ලුම් කිරීමේ දී ඔවුන්ගේ වයස අවුරුදු 16 ට අඩු විය යුතුය.

(iii) ජීවත්ව සිටී නම් දරුවාගේ මව සහ පියා යන දෙදෙනාම පැමිණිය යුතුයි.

(iv) දෙමාපියන්ගේ ගමන් බලපත්‍රවලට දරුවන්ගේ නම් ඇතුළත් කිරීමේ දී පහත සඳහන් ලියවිලි ඒවායේ ඡායාස්ථිති පිටපත් ද සමග ඉදිරිපත් කළ යුතු අතර, ඒවායේ මුල් පිටපත් ගමන් බලපත්‍රය සමඟ ආපසු එවනු ඇත. / ලබා දෙනු ඇත.

(අ) නම් ඇතුළත් කරනු ලබන දරුවාගේ / දරුවන්ගේ උප්පැන්න සහතික ඡායාස්ථිති පිටපත් ද සමග.

(ආ) ඉල්ලුම්කරුගේ ගමන් බලපත්‍රයට දරුවා / දරුවන් ඇතුළත් කිරීම සඳහා කලත්‍රයාගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය. කලත්‍රයා විදේශ ගත වී සිටීනම් එම ලිපිය අදාල තානාපති කාර්යාලයේ නිර්දේශය සහිතව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු වේ. විදේශ තානාපති කාර්යාල නොමැති රටවල් සඳහා පත් කර ඇති කොන්සාල්වරයාගේ අනු අත්සන සහිතව ඉදිරිපත් කළ යුතුය.

(ඇ) කලත්‍රයාගේ ගමන් බලපත්‍රයේ දත්ත පිටුව හා දරුවන් ඇතුළත් පිටුව (කලත්‍රයා විසින් ගමන් බලපත්‍රයක් ලබා ගෙන නොමැති නම්, ඒ බව සනාථ කිරීම සඳහා දිවුරුම් ප්‍රකාශයක් හා කලත්‍රයාගේ ජාතික හැඳුනුම්පත ඡායාස්ථිති පිටපතක් ද සමග.

(ඈ) කලත්‍රයා මියගොස් ඇත්නම් ඔහුගේ හෝ ඇයගේ මරණ සහතිකය.

(ඉ) දික්කසාද වී ඇත්නම් දික්කසාදය පිළිබඳ උසාවි නියෝගය හෝ අදළ සහතික ඉදිරිපත් කළ යුතුය.

(v) දරුවන්ගේ නම් ගමන් බලපත්‍රයට ඇතුලත් කිරීමේ දී අදළ දරුවාගේ වර්ණ ඡායාරූප 02ක් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය. එම ඡායාරූප සෙන්ටිමීටර් 2.5 × 3 ප්‍රමාණයේ විය යුතුය. දරුවන්ගේ ඡායාරූප ආකෘතිපත්‍රයේ ආකෘතිපත්‍රයේ අලවා, දකුණු පස ඡායාරූපය මෙහි අංක 7 හි සඳහන් කවර හෝ නිලධාරියෙක් විසින් සහතික කළ යුතුය.

(vi) දරුවාට නම අත්සන් කිරීමට නොහැකි නම් මව හෝ පියා විසින් දරුවාගේ නමෙහි කොටසක් අදළ හිස් කොටු දෙක තුළ ලිවිය යුතුය.

(vii) ගමන් බලපත්‍රයක් ලබා ගැනීමේදී එම අවස්ථාවේදීම දරුවන්ගේ නම් ඊට ඇතුළත් කරන්නේ නම්, ඒ සඳහා අතිරේක ගාස්තුවක් අය නොකෙරේ.

SMART
පුංචි පුංචි වැදගත් දේ කියන්න
ශ්‍රී ලංකාවේ තත්පරයට අයකරන අඩුම IDD ගාස්තු
Sri Lanka Telecom Mobitel
We Care. Always.

**(ඈ) අවුරුදු 16ට අඩු දරුවන් සඳහා වෙනම ගමන් බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ලිපිලේඛන :**

(i) ආ. වි. 35 'කේ' ආකෘතිපත්‍රය.

(ii) උප්පැන්න සහතිකයේ මුල් පිටපත ඡායාස්ථිති පිටපතක් සමග (ඉංග්‍රීසි පරිවර්තන උප්පැන්න සහතිකයේ මුල් පිටපත ලෙස නොසැලකේ.)

(iii) දෙමාපියන්ගේ ගමන් බලපත්‍රවල දත්ත පිටුවේ ඡායාස්ථිති පිටපතක් සහ ළමයින්ගේ ඡායාරූප පිටුවේ (පිටු අංක 6) ඡායාස්ථිති පිටපතක් සමග අදාළ ගමන් බලපත්‍රය.

(iv) දෙමාපියන් ගමන් බලපත්‍ර ලබා ගෙන නොමැති නම්, ඒ බවට දිවුරුම් ප්‍රකාශයක් හා දෙමාපියන්ගේ ජාතික හැඳුනුම්පත් සමග ඒවායේ ඡායාස්ථිති පිටපත්.

(v) දරුවන්ට වෙනම ම ගමන් බලපත්‍රයක් නිකුත් කිරීම පිළිබඳ දෙමාපියන්ගේ කැමැත්ත ප්‍රකාශිත ලිපි. (මව හෝ පියාගෙන් එක් අයෙක් හෝ දෙදෙනාම විදේශගතව සිටී නම්, ඔවුන්ගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය ෆැක්ස් මගින් ද ගෙන්වා ඉදිරිපත් කළ යුතුය.)

(vi) මව හෝ පියා හෝ මියගොස් ඇත්නම්, අදල මරණ සහතිකය ඡායාස්ථිති පිටපතක් ද සමග.

(vii) දෙමාපියන් දික්කසාද වී ඇත්නම්, දික්කසාද සහතිකය ඡායාස්ථිති පිටපතක් ද සමග.

(viii) දරුවාට වෙනම ගමන් බලපත්‍රයක් ලබා ගැනීමට පෙර, එම දරුවන් තම මවගේ හෝ පියාගේ වලංගු ගමන් බලපත්‍රයට ඇතුළත් කර තිබේ නම්, එය ප්‍රථමයෙන් ඉවත් කළ යුතු වන අතර, ඒ සඳහා ආ. වි. 35 "සී" පෝරමය පුරවා රු. 500.00ක ගාස්තුවක් සමග ඉදිරිපත් කළ යුතුය. (මෙම ගාස්තු සංශෝධනයට යටත් වේ.)

(ix) සෙන්ටිමීටර් 3.5 × 4.5 ප්‍රමාණයේ ඡායාරූප 3ක් ඉදිරිපත් කළ යුතුය.

(x) දරුවන් විදේශයක උපත ලබා සිටී නම්, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව නිකුත් කළ ශ්‍රී ලංකාවේ පුරවැසි සහතිකය ඉදිරිපත් කළ යුතුය.

**(ඉ) ගමන් බලපත්‍ර ලබාගැනීමේ දී පහත සඳහන් වැරදි කිරීම් 1955 අංක 16, 1961 අංක 68, 1993 අංක 16, 1998 අංක 42 සහ 2001 අංක 31 දරන පනත්වලින් සංශෝධිත 1948 අංක 2 දරණ පනතට අනුව දඬුවම් ලැබිය හැකි වරදකි :**

(i) අසත්‍ය තොරතුරු සැපයීම,

(ii) කූඨ ලෙස තැනූ හෝ ව්‍යාජ ලේඛන ඉදිරිපත් කිරීම,

(iii) වලංගු ගමන් බලපත්‍රයක් ළඟ තබාගෙන, තවත් ගමන් බලපත්‍රයක් ඉල්ලුම් කිරීම,

(iv) වෙනත් අයගේ ගමන් බලපත්‍ර පරිහරණය කිරීම,

(v) ලබාගත් ගමන් බලපත් ව්‍යාජ ලෙස වෙනස් කිරීම,

(vi) වෙනත් අයගේ ලේඛන ඉදිරිපත් කොට, ගමන් බලපත්‍ර ලබා ගැනීම.

**(ඊ) ගමන් බලපත්‍රයක් නැති වූ අවස්ථාවක පහත සඳහන් දෑ ඉදිරිපත් කළ යුතුය :**

(i) ගමන් බලපත්‍රය නැති වූ බවට පොලීසියේ කරන ලද පැමිණිල්ලේ මුල් පිටපත.

(ii) ගමන් බලපත්‍රය පිටරටකදී නැති වූයේ නම්, එම රටේ සිට ශ්‍රී ලංකාවට පැමිණි තාවකාලික ගමන් ලියවිල්ල. (ඡායාස්ථිති පිටපතක් ද සමග.)

(iii) ගමන් බලපත්‍ර ගාස්තුවට අමතරව, රු. 10,000.00 ක (රුපියල් දස දහසක) දඩ මුදලක්. (මෙම දඩ මුදල අයකරනු ලබන්නේ නැති වූ ගමන් බලපත්‍රයේ වසර 10ක වලංගු කාලය ඉක්ම වී නොමැති නම් පමණි.)

**(උ) ගමන් බලපත අයදුම්පත සහතික කළ හැකි අය :**

(i) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, අධ්‍යාපන පරිපාලන සේවයේ, ගණකාධිකාරී සේවයේ, ක්‍රම සම්පාදන සේවයේ හෝ ඉංජිනේරු සේවයේ නිලධාරියෙක්,

(ii) ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරියෙක්,

(iii) නීතීඥයෙක්,

(iv) සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියෙක්,

(v) යුධ, නාවික, ගුවන් හමුදා හෝ පොලීසියේ අධිකාරීලත් නිලධාරියෙක්,

(vi) තම ප්‍රදේශයේ පොලිස් ස්ථානයේ පොලිස් පරීක්ෂක (ස්ථාන භාර නිලධාරී),

(vii) තම ප්‍රදේශයේ සමෘද්ධි කළමණාකරු / ග්‍රාම නිලධාරී / සමාජ සේවා නිලධාරී,

(viii) තැපැල් ස්ථානාධිපතිවරයෙක් / රජයේ පාසලක විදුහල්පතිවරයෙක් / කම්කරු නිලධාරියෙක්,

(ix) වතු අධිකාරීවරයෙක්,

(x) සාමදාන විනිශ්චයකාරයෙක්,

**(ඌ) ගාස්තු :**

| | | එක් දින සේවය | සාමාන්‍ය සේවය |
|---|---|---|---|
| (i) | සියලුම රටවල් සඳහා ගමන් බලපත්‍රය ... ... ... ... ... | රු. 7,500.00 | රු. 2,500.00 |
| (ii) | මැද පෙරදිග ඇතුලු නිශ්චිත රටවල් සඳහා ගමන් බලපත්‍රය ... ... | රු. 2,500.00 | රු. 1,000.00 |
| (iii) | ඉන්දියාව සහ නේපාලය සඳහා හදිසි සහතිකය ... ... ... ... | - | රු. 500.00 |
| (iv) | ඉන්දියාව සහ නේපාලය සඳහා හදිසි සහතිකය ... ... ... ... | රු. 2,500.00 | - |

(ශ්‍රී ලංකා රජයේ තීරණ මත සියලුම ගාස්තු සංශෝධනය විය හැක.)

**(එ) භික්ෂූන් වහන්සේලා සඳහා ගමන් බලපත්‍ර ඉල්ලුම් කිරීම :**

(i) උප්පැන්න සහතිකයේ මුල් පිටපත සහ ජාතික හැඳුනුම්පත ඡායාස්ථිති පිටපත් සමග ඉදිරිපත් කළ යුතුය.

(ii) භික්ෂු සාමණේර සහතිකය හෝ උපසම්පදා සහතිකය ද ඡායාස්ථිති පිටපත් සමග ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ.

**(ඒ) රාජකාරී සහ රාජතාන්ත්‍රික ගමන් බලපත්‍ර වලට දරුවන් ඇතුළත් නොකෙරේ.**

* අයදුම්පත්‍ර භාර ගැනීම.

එක්දින සේවය : පෙ.ව. 8.00 - ප.ව. 1.30 දක්වා

සාමාන්‍ය සේවය : පෙ.ව. 8.30 - ප.ව. 2.00 දක්වා

SMART

කොළඹ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ මොබිටෙල් විශේෂ ශාඛාව වෙත පිවිසෙන්න.

Sri Lanka Telecom Mobitel
We Care. Always.